බසෙහි වරුණ



පී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

බෙසෙහි වරුණ

ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

බසෙහි වරුණ

ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

කර්තෘගේ වෙනත් කෘති :

- **සිතුවිලි ගෙත්තම්** (ISBN 978-624-208-824-2)
- **කනේරු මල්** (ISBN 978-624-211-076-9)

පාසල : **මහ/ස්වර්ණමාලි බාලිකා විදුහල**

ඉගෙනුම ලබන පංතිය : **10 ශ්‍රේණිය**

කෘතිය පල කරන දිනය : **25.04.2026**

ISBN අංකය : 978-624-208-996-6

පිදුම

නිති නිසි මග කියමින් මගේ අනාගතය එළිය කරන්නට

වෙහෙසෙන සෙනෙහෙබර අම්මාටත්, අප්පච්චිටත්,

අත්තම්මලාටත්,මගේ ආදර නැගණියන්ටත්,

මාර්ගෝපදේශ සපයමින්

ගුණයෙන් නැණයෙන් පිරිපුන් දියණියක් සමාජයට

දායාද කරළීමට උරදෙන

ස්වර්ණමාලි විදුහල්පතිනිය ප්‍රමුඛ ඇදුරු මඬුල්ලටත්,

ලේඛන කලාවට අත්පොත් මුලින්ම තැබීමට අත්වැල් සැපයූ

සිදුහත් විදුබිමේ ඇදුරු මඬුල්ලටත්,

ඛස පිරික්සමින්, ඔවදන් සපයමින් මා දිරිමත් කරන

සිසිර ගමගේ සීයාටත්,

හේමමාලා උපහාර වැඩසටහනට සම්බන්ධ කරගනිමින්

අවස්ථාව ලබා දුන් මහමායා විදුහලේ

සෙනෙවිරත්න ගුරුතුමන්ටත්,

මගේ සදාදර යෙහෙළියන්ටත්, නෑ හිත මිතුරන්ටත්

මේ පොත් පිංච සෙනෙහෙ සිතින්

පුදමි...

පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

පටුන

පිටු අංක

1.	අපේ බස	1-2
2.	උප භාෂා හැඳින්වීම	3
3.	විශ්ව විද්‍යාල උප භාෂාව	4-6
4.	ත්‍රීවිල් සහ බස්රථ ආදියෙහි අපට හමුවන වැකි	7-12
5.	බන්ධනාගාර උප භාෂාව	13-15
6.	දේශපාලන වේදිකාව මත ඇසෙන භාෂාත්මක යෙදුම්	16-17
7.	දේශපාලන වේදිකාවේ නායකයන් උදෙසා විවිධ යුගවල බිහි වූ ගීත	18-22
8.	මව් භාෂාව හැර වෙනත් භාෂාවක් කතා කරන අවස්ථා	23
9.	වර්තමානයේ පොදු සමාජය තුළ භාවිතා වන වචන	24
10.	වෙනත් ව්‍යවහාර	25
11.	හෙළ බස සුරකිමු	26
12.	ස්තූතිය	27

අපේ බස

සියවසින් සියවසට සිංහල අකුරු සකස් වෙමින් ආ සිංහල භාෂාවෙහි ආරම්භය හා විකාසනය පිළිබඳව තොරතුරු දැනගත හැකි ලේඛනාවලියක් අප සතු වේ. සිංහල භාෂාව යනු ද්වීරූපිතා භාෂාවකි. එනම් එහි කථන බස හා ලිඛිත බස යන ආකාර දෙකකි. ඒ නිසාම ලොව බොහෝ භාෂාවන්ට වඩා සිංහල භාෂාව සුවිශේෂිත ය. ලොව බොහෝ සාහිත්‍යය කෘති ලිඛිත භාෂාවෙන් ලියවී තිබුණද කථන බසින් ලියූ සිංහල සාහිත්‍යය කෘතීන්ද සිංහල භාෂාව සතුය. 2014 වර්ෂයේ ලොව පවතින සියලු භාෂා එක්තැන් කරමින් දකුණු කොරියාවේ ෂියෝන්හි පැවති භාෂා තරගාවලියේ විශිෂ්ට ස්ථානයක්ද ලබා ගැනීමට හැකිවීමත් අප ලද මහඟු ජයග්‍රහණයකි. මේ වෙනුවෙන් පුරෝගාමීව කටයුතු කළ මහාචාර්ය ජේ.බී. දිසානායක මහතාට ද සුවිශේෂී ගෞරවයක් හිමි විය යුතු බවද මතක් කර සිටිමි.

එපමණක් නොව ලොව අනෙක් අක්ෂර මාලාවන්ට වඩා සිංහල අක්ෂර මාලාව සුවිශේෂී වන්නේ එයටම පමණක් ආවේණික සඤ්ඤක අකුරු පහක් තිබීමත් "ඇ" කාරය පැවතීම, අල්පප්‍රාණ මහාප්‍රාණ අක්ෂර ආදී වර්ගීකරණයන් තිබීම හේතුවෙන්ය. ඒ වගේම මහාචාර්ය ජේ.බී. දිසානයක මහතා "ඦ" යනුවෙන් ශබ්දයක් ද හඳුන්වා දී තිබේ. සැබැවින්ම "අර්නස්ට්", "මර්වින්" වැනි ඉංග්‍රීසි බසින් පැමිණි වචන ලිවීමේදී මතුවන ගැටළු සහගත තත්ත්වය එතුළින් මග හරවා ගත හැකි බව අපට පැහැදිලි වේ. "බසෙහි වරුණ" පිළිබඳ ප්‍රවේශයක් ගැනීමේදී මට ඉහත කරුණු බැහැර කළ නොහැකි බවත් ලියා තබමි.

සාහිත්‍යයේ මාධ්‍යය භාෂාව ලෙස අපි බොහෝ දෙනා දනිමු. එමෙන්ම මනුෂ්‍යයන්ගේ හැඟීම්, අදහස් ප්‍රකාශ කරන ප්‍රධාන මෙවලම භාෂාවයි. සාහිත්‍යකරුවා සේම සමාජයේ අනෙකුත් පුද්ගලයින් භාෂාව භාවිත කරන්නේ තම තමන්ට ආවේණික ලෙසයි. මෙය ඇතැම් තැනෙක 'ශෛලිය' ලෙසද හඳුන්වයි. එක් එක් යුගවලදී ද එදිනෙදා කථා ව්‍යවහාරය වෙනස්වෙමින් පැවත ආවකි. අතීතයේ සිට මේ දක්වා ආ ගමන් මගේ කථා බහ බොහෝ වෙනසකට ලක්වෙමින් පවතී.

ඕනෑම කතාවක එයටම උරුම වූ භාෂා සම්ප්‍රදායක් පවතී. එම භාෂාව නියෝජනය කරන සමාජයේ තිබෙන ජීවන වෘත්තීන්, සිරිත් විරිත්, ඇදහීම්, සිතුම් පැතුම්, ආකල්ප තිබේ. එදා සිට මේ දක්වා මානව සත්ත්වයා අනෙකුත් සත්ත්වයන්ගෙන් වෙනස්ව විශේෂ වීමට හේතුව මිනිසා සතු භාෂා හැකියාවයි. අපට උරුම සංස්කෘතිය තුළ යම් යම් උප සංස්කෘතීන් අද දක්නට ඇත.

එලෙස පොදු සංස්කෘතිය පිළිගන්නා අතර ම ඊට මදක් වෙනස් වූ සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ගෙන් යුක්ත වූ ජන කණ්ඩායමක හැසිරීම උප සංස්කෘතියක් ලෙස හඳුන්වයි. ඒවගේම එක් එක් වෘත්තීය හා සබැඳුණු පරිමිත භාෂාවන් ද අපූරු භාෂා අලංකරණයකි. මෙලෙස ප්‍රාදේශීයව, භූගෝලීයව, වෘත්තීය වශයෙන්, ජනවාර්ගික ආදි කරුණු හේතු කොටගෙන උප සංස්කෘති ඇතිව ඇත. ඒ තුළ භාෂාව මූලික සාධකයක් බව අපට හොඳින් ඉස්මතු වේ.

මගේ කෘතිය තුළින් මා බලාපොරොත්තු වන්නේ රැකියාව, ස්ත්‍රී පුරුෂ බව, කුලය, වාර්ගිකත්වය ආදී හේතු නිසා ඇතිව තිබෙන උප භාෂා විලාසයන්ගෙන් තිබෙනවා සේම විශ්ව විද්‍යාල තුළ, ත්‍රීරෝද රථ රියදුරන්, බන්ධනාගාරය තුළ, දේශපාලන වේදිකාව හා සාමාන්‍ය එදිනෙදා ජීවිතයේදී අපට හමුවන, කතාබහ කරන අවස්ථාවල භාවිතා වන යෙදුම් ඇසුරෙන් සිංහල භාෂාව වත්මනෙහි ව්‍යවහාර කරන්නේ කෙලෙසින්දැයි බිඳක් ඔබ වෙත ඉදිරිපත් කිරීමටයි. එය කොතෙක් දුරට ඔබට සමීප වේදැයි මා නොදනිමි. එහෙත් ලියා තබමි.

උප භාෂා හැඳින්වීම

එදා මෙදා තුර මානවයා සත්ත්වයාගෙන් වෙනස් වීමටත් විශිෂ්ටත්වයට පත්වීමට මූලික හේතුව මානවයා සතු භාෂා හැකියාව නිසාම ය. ඒ අනුව මානව සංස්කෘතියේ මූලිකාංගය වන්නේ භාෂාවයි. මෙම මහ සංස්කෘතිය යටතේ යම් යම් උප සංස්කෘති දක්නට ලැබේ.

උප සංස්කෘතිය යනු, පොදු සංස්කෘතිය පිළිගන්න අතරම එයින් පැහැදිලිව වෙනස් වූ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් යුක්ත වූ ජන කණ්ඩායමක් හැසිරීමයි. උප සංස්කෘතිය ඇතිවීමට බලපෑ හේතු කිහිපයක්ම ඇත. එයින් ප්‍රාදේශිකත්වය, භූගෝලීය විවිධතාව, රැකියා, වයස, ජන වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂභාවය හා කුලය ඉන් ප්‍රධාන වේ. ප්‍රදේශ විවිධතාව අනුව උප භාෂා දක්නට ලැබෙන ප්‍රදේශ මාතර, දිගාමඩුව, මොනරාගල, බස්නාහිර පළාත් දිස්ත්‍රික්ක ඊට නිදසුන් වේ.

මෙලෙස රැකියා, වයස, ස්ත්‍රී පුරුෂ බව, කුල වාර්ගිකත්වය ආදී හේතු නිසා විශ්ව විද්‍යාල උප භාෂා සංස්කෘතිය, ත්‍රීරෝද රථ උප සංස්කෘතිය, මිතුරුකම හා බැඳුණු උප සංස්කෘතිය, බන්ධනාගාර උප භාෂාව ඇති වී ඇත.

විශ්ව විද්‍යාල උප භාෂාව

විශ්ව විද්‍යාල භාෂාව මහා සංස්කෘතියේ භාෂාවෙන් පැහැදිලිව වෙනස් වූවකි. විශ්ව විද්‍යාලය තුළ පරිමිත භාෂා ව්‍යවහාරයකි. බොහෝ විට ප්‍රාදේශීය විවිධත්වය ආරක්ෂා වීමටත්, බාහිර සමාජයේ වෙන්වීමේ අවශ්‍යතාවක් නිසා මෙම විශ්ව විද්‍යාල භාෂා ඇති වී තිබේ.

විශ්ව විද්‍යාලය තුළ පුද්ගලයින් හැඳින්වීමට විශ්ව විද්‍යාලයන්හි උප භාෂාව තුළ පොදුවේ ව්‍යවහාරය වන වචන තිබේ. විශ්ව විද්‍යාලය තුළ සිටින උප කුලපති "වීසී මහජන", "වීසිකාරයා" ලෙසත් උප කුලපතිනි ලොකු අම්මා ලෙසත් හඳුන්වයි. තවද මහාචාර්යවරයාට "ප්‍රොෆා" ලෙසත්, දේශකයාට "ලෙචා" ලෙසද කියයි. කනිෂ්ඨ සිසුවාට "ජින්නා" ලෙසද අමතනු ලබයි. විශ්ව විද්‍යාලයට පැමිණෙන නවක සිසුවාට හා සිසුවියට "ෆ්‍රෙෂා, ෆෙෂී" ලෙසද, පෙම්වතා පෙම්වතිය "කොක්ක" ලෙසත් හඳුන්වයි. තමන්ගේ වසරේ සිටින සිසුවා හෝ සිසුවිය බැචා හා බැචී ලෙස හඳුන්වයි. බෝඩිමෙහි හෝ නේවාසිකාගාරයේ තමා සමඟ එක කාමරයේ සිටින්නා හට රූමා යයි අමතයි. විශ්ව විද්‍යාලය තුළ සිටින විරූපී තරුණියන් හට වෙනම නම් භාවිතා කරයි. මදක් විරූපී තරුණියන්ට "යකා" යයි කියයි. එයට වඩා විරූපි වූ එක් සොමියක් ලැබෙන තරුණියට "සොමි යකා" ලෙසත් එයට වඩා විරූපී වූ තරුණිය හට "සිරි යකා" ත් හොඳටම විරූපී

තරුණියට "අම්බ යකා" ලෙසද අතිශයින් විරූපී වූ යකෙක් හා සමාන භායානක පෙනුමක් ඇති තරුණියට "අම්බානක් යකා" ලෙසද විශ්ව විද්‍යාලයට තුළ ව්‍යවහාරය වේ.

විශ්ව විද්‍යාලය තුළ අධ්‍යාන කටයුතු සම්බන්ධ ව්‍යවහාරය වන වචන ඇත. "ගිරවා දැමීම" කට පාඩම් කිරීම ලෙසත්, "ක්‍රෑම" යනු පාඩම් කිරීමයි. කැළණිය විශ්ව විද්‍යාලය තුළද ක්‍රෑම වර්ග 5 ක් ඇත. "ජංගම ක්‍රෑම" එනම් ඇවිදිමින් පාඩම් කිරීමයි. "බෝග ක්‍රෑම" යනු වැසිකිළියට වී පාඩම් කිරීමයි. "ජංගම ක්‍රෑම" යනුවෙන්ද ක්‍රෑම වර්ගයක් ඇත. එනම් එළිමහනේ ගස් යටට වී පාඩම් කිරීම. "ගරිල්ලා ක්‍රෑම" යනු අන් අයගේ සටහන් හොරකම් කර පාඩම් කිරීමයි. "මෙන්ඩිස් ක්‍රෑම" යනු ආත්මාර්ථකාමී ලෙස අන් අයට උදව් නොකරමින් පාඩම් කිරීමයි. කැලණි විශ්ව විද්‍යාල තුළ ඇති ක්‍රෑම වර්ග 5 ඉහත ඇත.

"කුප්පි දැමීම" විභාග ආසන්නයේ දී සිසුහු අනෙක් සිසුන්ට කරුණු කියා දීමයි. මෙහි උප වර්ගයක් නම් "කුප්පියේ" ප්‍රයෝජනය ලබන්නෝ සියල්ල ශිෂ්‍යාවන් නම් එය "මල් පාත්තිය" කි.

පේරාදෙණිය සරසවියේ එක් එක් විෂයන්ට ද නම් පවතී. සමාජ විද්‍යාවට "සමාජ රෝග" ලෙසද, මනෝ විද්‍යාවට "පිස්සු විද්‍යාව" ද, දේශපාලන විද්‍යාවට "බෙල්ල කැපීම" ලෙසද, ගණිතයට "මීටරය අවුල් කිරීම ද, ඉංග්‍රීසි විෂයට "කඩ්ඩ" ලෙසද, දර්ශන විෂයට "පිස්සු දැකීම". තවද ආර්ථික විද්‍යාවට "සූරා කෑම" ලෙස ද හඳුන්වයි.

සහජ දක්ෂතා මත විභාගය පාස් වන්නේ "මීටරය" සහිත පුද්ගලයෝය. කට පාඩම් කර විභාග සමත් වන්නේ "මෝටරය" මගිනි. විභාගය අසමත් වීම "ඇණ ගැනීම" යි. එවිට "රිපීට්" වීමට සිදු වේ. එනම් ඊළඟ වසරේ නැවත ලිවීමයි. තවත් ආකාරයක ඇණ ගැනීමක් ඇත. එනම් පෙම්වතිය තමා අතහැරීමයි.

විශ්ව විද්‍යාලය තුළ දේශපාලන සම්බන්ධ උප භාෂාව ඇත. විශ්ව විද්‍යාලය තුළ ක්‍රියාත්මක වන සිසු දේශපාලනය මගින් ද යම් සුවිශේෂී වචන ප්‍රමාණයක් නිර්මාණය වී තිබේ. විශ්ව විද්‍යාලයේ ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී සිසුන් "ජෙප්පෝ" නම් වේ. විශ්ව විද්‍යාලයේ සාරධර්ම කඩ කරන පුද්ගලයා "අල වැඩ කරන්නෙකි".

මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා "මහා ශිෂ්‍යයා" නමින් හඳුන්වයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවිදි වී සිට සිවුර හල පුද්ගලයා "ලටෙක්" යනුවෙන් හඳුන්වයි.

විශ්ව විද්‍යාල හැඳින්වීමට ද සිසුන් අතර නම් වේ. සබරගමුව විශ්ව විද්‍යාලයට "බෙලිහුල්ඔය මහා විද්‍යාලය", රුහුණු විශ්ව විද්‍යාලය "හුලං කන්ද මහා විද්‍යාලය", කැළණිය විශ්ව විද්‍යාලය ලෙස හඳුන්වයි.

තුම්මුල්ල මොන්ටිසෝරිය, කොළඹ විශ්ව විද්‍යාලය, පේරාදෙණිය සරසවියේ විවිධ පීඨයන් හැඳින්වීමට යොදා ගන්නා නම් ඇත. "පින්තූර කඬේ" ශාස්ත්‍ර පීඨය ද, "මස් කඬේ" වෛද්‍ය පීඨය ද, දන්ත වෛද්‍ය පීඨය හඳුන්වන්නේ "දත් කඬේ" නමින් ද, පශු වෛද්‍ය පීඨය "බලුමස් කඬේ" ලෙස ද, විද්‍යා පීඨය "සයිකල් සයිකල් කඬේ" ද, කෘෂි විද්‍යා පීඨය "මඩ කඬේ" ද, සම සෞඛ්‍යවිද්‍යා පීඨය "සාත්තු කඬේ" ලෙස සිසුන් අතර ව්‍යවහාරය වේ.

මෙලෙස විශ්ව විද්‍යාලය තුළ ව්‍යවහාර කරන බස ඔවුන්ටම ආවේණිකව හැඩගස්වාගෙන ඇති අතර ඔවුන්ගේ නම් සඳහා ද අන්වර්ථ නාමයන් පටබැඳ ඇත. ඒවා බොහෝ දුරට විශ්ව විද්‍යාල ජීවිතයෙන් පසුවත් භාවිතා වෙන ආකාරයක් දිස්වේ. උදාහරණ නම් කිහිපයක් ලිය තබමි.

ලැන්ටා, ලපයා, බෝක්කු, හතරවරං, දීගජන්තු, පලංචියා, මහසෝනා, ඩාවින්චි, අලයා, වැලයා ඉන් කිහිපයකි.

ත්‍රීවිල් සහ බස්රථ ආදියෙහි අපට හමුවන වැකි

ත්‍රීවිල් ජීවිතේ වදන්

මෙම " ත්‍රීවිල් වදන්" කියන්නේ සාමාන්‍යයෙන් ත්‍රීවිල් රියදුරන් පස්සේ හොඳම කතා, පරමාර්ථ, හුස්මටත් හිතටත් දැනෙන වචන, හඬන-හෙළන වින්දනා සහ දැඩි ජීවිත පරීක්ෂණ ගැන කියන ජීවිත ධර්ම තියෙන වදන් ලෙස පාවිච්චි වෙනවා.

"පාර දිග-ජීවිතත් දිග, හැබැයි එක එක ගිවිසුමකින් කපාලා." ත්‍රීවිල් රියදුරා මිනිස් ජීවිතයත් පාර වගේ කියලා හිතනවා. දිගයි, විවිධ මග තියෙනවා. නමුත් ජීවිතය කැපෙන්නේ, වෙනස් වන්නේ පුද්ගලයින් අතර ඇති වන ගිවිසුම්-විශ්වාස, සම්බන්ධතා, පොරොන්දු-මෙවලම් බිඳෙන විට ය. පස්සෙන් කතා කරන්න ලොකු රට - ඉස්සරහ දුවන්නේ මම විතරය" වැරදි දූෂණ, විවේචන, මැදිහත් වීම, "ඔහොම යන්න" කියන අය - ඉතා නමුත් සත්‍ය ගැටලුවලට මුහුණ දෙන, වෙහෙසෙන, ඉස්සරහින් ගමන් කරන ප්‍රායෝගික මිනිසා තනි මට

දුකක් කියන්න එපා ලීටර් එකේ ගෑස් ගාන අහලා මගේ හදවත මැරෙන්නේ හිතට පටිලාත වන විහිළුවක්. නිතර තත්ත්වය උචිත ලෙස විස්තර රියදුරු පරායිකාව - ජීවිතයේ දෛනික අඩුපාඩු, දෛනික පීඩනය හා අනාගත අවිශ්වාසය. ත්‍රීවිල් වදන් කියන්නේ වචන සරල හෝ ගැඹුරු හිතට වැදී යන වචනයි. සමහර ත්‍රීවිල් වදන් අපේ සිනහවට හේතු වෙනවා, මතක තබා ගන්න පහසුයි සහ සමහර විට සොඳුරු මතකයන් නිර්මාණය කරනවා.

සාමාන්‍ය ජන ජීවිතයේ ත්‍රීවිල් වදන්

- අඳුර ලොව රජ වෙලා. මිනිස් සිත ගොළු වෙලා.
- සීනි බෝතලේ ඇරලා බොරුවට කූඩිත්තන්ට බනින්න එපා.
- කොයි ලොව යන්නේ මරණින් පස්සේ පිං පව් එනවා අපි පසු පස්සේ.
- ආස දේවල් ලාබ උනානම් හීන එච්චර ආතල් නෑ.

මිත්‍රත්වය පිළිබඳ ත්‍රීවිල් වදන්

ත්‍රීවිල් වදන් තුළ මිත්‍රත්වය ගැන හරි අපූරුවට සඳහන් වී තිබේ. ත්‍රීවිල් වදන් යනු වචන සරල හෝ ගැඹුරු හිතට වැදී යන වචනයි. ඒවා නිවැරදිව වචන සමඟ මිශ්‍රව යාළුවෝ හඳුනාගන්න, ජීවිතේ පාඩම් තේරුම් ගන්න උදව් කරනවා. ජීවිතේ යාළුවෝ ගොඩක් හිටියා කියලා සාර්ථකත්වයක් නොලැබේ. ඒක හොඳ, සැබෑ යාළුවෙක් හිතට බැඳුණා නම් ඒක ලොකු වාසනාවක්.

සත්‍ය මිත්‍රයෙක් කියන්නේ අපේ ළඟයි කියලා නෙමෙයි, අපි වැරදි කළ විටත් අපිට උදව් කරන කෙනා ජීවිතේ හොඳ යාළුවෝ කාලයත් එක්ක හැමදේම පෙනෙනවා වචන, ක්‍රියා හා ආදරයෙන් එක හොද සැබෑ යාළුවෙක් ලැබුණාම ජීවිතේ ලොකු වාසනාවක්ද වේ. සත්‍ය මිත්‍රත්වය වගේම වාසියට පමණක් ඉන්නා යාළුවෝ අපිට හොද කාලෙට ළඟයි. එවැනි බැදීම් අපිව රිද්දුවත් අපිට මිනිස්සු හඳුනාගන්න ඇස් දෙකක් දෙනවා. ඒකත් ජීවිතේට පාඩමක්. සැබෑ යාළුවෝ අපිව ශක්තිමත් කරනවා, වාසියට පමණක් ඉන්නා අය අපිව බුද්ධිමත්

කරනවා. එම නිසා දෙකම ජීවිතේට වැදගත්. දැන් අපි මේ පිළිබඳ කියවෙන ත්‍රීවිල් වදන් පිළිබඳ විමසා බලමු.

"හිතට වැදුණු හොඳම යාළුවා විතරයි ඉන්නේ යාළුවෝ කියලා ජාතියක් නෑ උන් ඉන්නේ අවස්ථාවට විතරයි තමයි."

සමහර වෙලාවට "මම වෙනුවෙන් ඉන්නේ මේකා විතරයි." කියලා හිතුවත් ඒ ඉන්නේ හොඳම යාළුවා විතරයි.

"තමන්ගේ සැබෑ යාළුවා හම්බවෙන්නේ වෙන්වන විටදී" වෙන්වීම්, දුක, ප්‍රශ්න යාළුකම් හඳුනාගන්න හොඳ වෙලාවත් ඒ වෙලාවලත් අපිත් එක්ක ඉන්න කෙනා සැබෑ යාළුවා කියලා හදවතටම දැනෙනවා. සමහර ත්‍රීවිල් වදන් තමන්ගේ සැබෑ ජීවිතේ අත්විඳින්න සිදුවන දේවල් බව නිසැකයි. "සමහර යාළුවෝ හිටියා පවුලේ එකෙක් වගේ" ලේ සම්බන්ධය නැති වුණත් පවුලක අපිට ළඟින් ඉන්න යාළුවෝ ඉන්නවා. එවැනි යාළුවෝ අපේ ජීවිතේ ලොකු වාසනාවක් කියලා කියන්න පුළුවන් "පිටතින් හරි වෙනස්, සමහරුන් ඇතුළත ගොඩක් යාළුවෝ එහෙමයි බං" පිටින් හොඳට කතා කරලා හිනාවෙන හැමෝම හොඳ අය නෙවෙයි. ඇතුළත ඊර්ෂියාව, වෛරය තියෙන අයත් ඉන්නවා. ඒ නිසා අපි මිනිස්සුන්ව වචනවලින් නොමෙයි, ක්‍රියාවෙන් හඳුනා ගන්න ඕන. ඔබටත් සිටිනා විය හැකි සැබෑ යාළුවෙක් "සැබෑ මිත්‍රත්වයට වඩා වටින දෙයක් මේ ලෝකේ නෑ." සල්ලි, දේවල්, තත්ත්වය එක දවසක නැති වෙන්න පුළුවන්. නමුත් සත්‍ය මිත්‍රත්වයක් හදවතට ශක්තියක්. එවැනි යාළුවෙක් ඉන්න එක ජීවිතේ ලොකු සම්පතක්. "කාලේ ගියත් අඳුරගන්න බැරි යාළුවො ඉන්නවා පරිස්සමින්" කෙතරම් කාලයක් යාළුවෝ වෙලා හිටියත්, සමහරුන්ගේ ඇත්ත ස්වභාවය හඳුනාගන්න අමාරුයි. ඒ නිසා අපි හැමෝටම අධික විශ්වාසය දාන්න කලින් ටිකක් පරිස්සම් වෙන්න ඕන. "යාළුවෝ නම් ගොඩයි. ඒත් හිතට බැඳුණ උන් එකයි." පාසලේ, සමාජ ජාලවල යාළුවෝ ගොඩක් ඉන්න පුළුවන්. නමුත් හිතේ දුක, සතුට කියන්න පුළුවන් එක් කෙනෙක් විතරක් ඉන්න එක ලොකු වාසනාවක්. ප්‍රමාණය නෙමෙයි හදවතට ඉදීමයි වැදගත්. "තරහ වෙද්දි එක එක බොරු කතා හදද්දී නම් හිතට අමාරුයි මචං" යාළුවෙක් එක්ක තරහ වුණාම අපි ගැන බොරු කතා හදලා වෙන අයට කියන එක හිතට ගොඩක් රිදෙන

දෙයක්. සැබෑ යාළුවෙක් තරහා වුණත් අපේ නම කැඩෙන්න දෙන්නේ නෑ. එවැනි වෙලාවට අපි තේරුම් ගන්න ඕන කවුද ඇත්තටම අපිව ආරක්ෂා කරන්නේ කියලා.

ත්‍රීවිල්වල නිතරම දකින්නට ලැබෙන පාඨයකි මේ. "යාළුවොත් අඳුරනවා යාළුවෝ වගේ රඟන එවුනුත් හොඳට දන්නවා" ජීවිතේ අපට මුණගැහෙන හැමෝම සත්‍ය යාළුවෝ නෙමෙයි. සමහරු යාළුවෝ වගේ සිනා වෙලා, කතා කරලා ඇතුළතින් වෙනම අදහසක් තියෙනවා. අපි ටිකක් ලොකු වෙද්දි තේරෙනවා කවුද සත්‍ය, කවුද රඟපාන්නේ කියලා. ඒ හින්දා හැමෝටම හදවත පූර්ණයෙන්ම විවෘත කරන එක හොඳ දෙයක් නෙමෙයි. "අපි නැති වෙලාවට අපි ගැන වෙනස් විදියට කතා කරන කෙනා යාළුවෙක් නෙමෙයි." සැබෑ යාළුවා අපි ඉන්නකොටත්, නැති වෙලාවටත් එකම ගෞරවයෙන් කතා කරයි. අපි පිටිපස්සේ අපිව අවම කරලා කතා කරන කෙනා මුහුණට හිනා වුණත් හදවතෙන් අපිට ළඟ නෑ. "වාසියට බැඳුණු යහළුකම් අපිට පාඩම් දෙයි, සත්‍ය යහළුකම් අපිට ජීවිතය දෙයි." වේදනාවත් එක්ක ඉගෙනගන්න පාඩම් අනාගතේ අපිව ආරක්ෂා කරනවා. සත්‍ය යාළුවෝ අපිව වැරදි දෙයකට ඇදලා දාන්නේ නෑ. ටොක්කක් හරි ඇනලා අපිව හොඳ දේට අපි නොදන්න දේවල් කියලා දෙනවා.

"වාසියට ඉන්න යාළුවා අපිව උස්සන්නේ නෑ, අපිව පාවිච්චි කරයි." තමන්ගේ හොඳම යාළුවා අපේ ජීවිතේ හරි මගට ගන්න හා අපිට හොඳක් කරන්න නිතරම බලනවා. ශිෂ්‍යය ජීවිතේ උදාහරණයක් සලකා බැලුවහොත් වාර විභාගයට තමන්ට වඩා එක ලකුණක් හරි ගන්නවට තමා කැමති. නමුත් අනික් යාළුවෝ අපිට හොඳක් කරන්නේ නෑ. සමහර යාළුවෝ කාලයත් එක්ක මැකෙන්නේ නෑ හදවතට ගැඹුරු වෙයි. අපිව බිඳිලා ඉන්න වෙලාවට, අපිව එකතු කරන කෙනා තමයි යාළුවා කියන්නේ. "හොඳම යාළුවා අපේ සතුට දෙගුණ තෙගුණ කරයි, දුක අඩු කරයි." සතුට බෙදා ගත්තොත් වැඩි වෙයි. දුක බෙදා ගත්තොත් සැහැල්ලු වෙයි. ඒකට එකම හේතුව අපිට ඉන්න එකම යාළුවා අපිට ඇතිවන දුක බෙදා ගන්න ඉන්න එකම කෙනා සහෝදරියන් වගේ ඉන්න යාළුවා. යාළුවා කියන්නේ අපි නිහඬව ඉන්නකොටත්, අපේ හිත තේරුම් ගන්න එකම කෙනා වචන නැති වෙලාවටත් හදවතේ දේ තේරුම් ගන්න පුළුවන් නම් ඒක ගැඹුරු යාළුකමක්. අපි වැරදි

කරනකොට ඔළුව උඩ තැබීම නෙමෙයි යාළුකම, අපිට වැරදි කියලා පෙන්නලා දෙන එකයි සත්‍ය යාළුකම. මෙය පිළිබඳ මනාව පැහැදිලි වන පාඨයකි "අපි වැරදි කරනකොටත්, අපිව හරියට ඇදගන්න කෙනා තමයි හොද යාළුවා." මේ සියලු පාඨයන් තුළ අක්ෂර වින්‍යාසය සදොස් වීමක් දැකිය හැකි කරුණකි.

මේවාද මට හමු වූ ත්‍රීවිල් වදන්ය.

- රයිඩ් Shuwer නම් සෙල්ලම Nothing.
- ආස දේවල් ලාබ උනානම් හීන එච්චර ආතල් නෑ.
- දීලා මට පටාවාරා ලයින් එයා ගියා දූරාචාරයේ පයින්.
- පාර රජයේ උනාට මේ පාරේ සෙල්ලම මගේ.
- අදූර ලොව රජ වෙලා මිනිස් සිත ගොළු වෙලා.
- අවේලාවේ රඟන යකාට වඩා වෙලාවට බහින ගුරා භයානකයි.
- බලන් ඉන්න බැරි උස් ගහයි අපට පෙනෙන්නේ.
- අවිස්වාසනම් මගේ දැන් මට ජීවිතේම තියලා ගිහින් එද්දි දුක හිතේවි කොච්චර පරිස්සම්ද කියලා.
- හිනවයි වැදගත් මම කවදත් එදා වගේමයි තවමත්.
- සිද්ධිය උනාට පස්සෙ අඩල වැඩක් නෑ බුද්ධියෙන්.
- හිතන දේ වෙන්නෙ නෑ වෙන දේ හිතා ගන්න බෑ.
- ලැබෙන විදියට සතුටු වෙන එකෙක් මං.
- වස හොඳයි බං විස මිනිසුන්ට වඩා.
- කෝ පුතේ යාළුවෝ.. සල්ලි ඉවරයි අම්මේ.
- පද හැදීම කලාවක් නම් අපේ ගම කලාගාරයක්
- අපරාදේ කියන්න බෑ සෝක් අවුරුද්ද හෙනයක් විතරයි ගැහුවේ නැත්තේ
- අම්මා සදක් වූ මගේ ලෝකේ මුළු අහසම නුඹයි තාත්තා
- අපි බොක්කෙන් - අපිට බෙලෙක්කෙන්
- සම්බුදු සරණයි. එන්ජිම පරණයි.
- අපේම නයි අපේම කයි.
- රුසියාවට වඩා ලොකුයි ඉරිසියාව.
- පුලුවන් තැනැත්තා කරයි, බැරි තැනැත්තා කරන හැටි උගන්නයි.

- දෙන්නෙක් සටන් වදින හැමවිටම උස්වැන්නෙකු දිනන්ට ඉඩ තිබේ.
- ගුල්ලා රජ වන්නේ බාල ලැල්ලේදී පමණි.
- හීන පස්සේ පන්නන දඩයක්කාරයා
- වැටෙන්න පුළුවන්.. නමුත් නැගිටින්නත් පුළුවන්..

මේවා මෑත කාලයේ වාහනවල පිටුපස බොහෝ සෙයින් ප්‍රදර්ශනය කර ඇති වැකි බොහෝ දුරට සම්ප්‍රදායික යෙදුම් තුළ එන ප්‍රස්තාව පිරුළු හා ඉඟිවැකිවලට සමානකමක් දක්වයි. එදිනෙදා ජීවිතය ගත කරන මිනිසුන් ඔවුන් ලබන අත්දැකීම් ඇසුරින් බිහි වූ මෙවැනි පාඨ අප කාටත් දර්ශනය වන්නකි. එවැනි වැකි ස්ටිකර් ලෙස සැකසූ වෙළඳසැල් ද දැක ගත හැකි වේ. ඒවා කියවන විට සැබවින්ම එවැනි දේ අප ද අත්දැක ඇති බැවින් ඇත්ත නේද? යැයි ඉබේටම වාගේ අපගේ මුවින් පිට වේ.

බන්ධනාගාර උප භාෂාව

බන්ධනාගාරය හෙවත් හිරගෙවල් යනු දඬුවමක් ලෙස රජයේ අධිකාරිය මත පුද්ගලයන්ගේ නිදහස සීමා කර බලෙන් රඳවා තබන ස්ථාන වේ. බන්ධනාගාර රැඳවියන් හට නිදහස ස්වාධීනත්වය, මානසික සුවය, අහිමිව නිරතුරුවම පාලකයන්ගේ රැවුම්, ගෙරවුම්, තාඩන පීඩනවලට යටත්ව පීඩිත ජීවිතයක් ගත කරන සිරගත වූවකුට සතුට සොම්නස සහජීවනය නින්දෙන් දකින සිහිනයක් වැන්න. මානව සාමජයක වටපිටාව එම සමාජ සංස්කෘතියේ ස්වභාවය තීරණය කිරීමට ප්‍රබල නිර්මාණයක් වෙයි. ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති බන්ධනාගාර ව්‍යුහය සකස් වී ඇත්තේ සිරකරුවන් රඳවා තබන බන්ධනාගාර, ලොක්අප් (Lockup), කඳවුරු, සැකකරුවන් රඳවා තබන රිමාන්ඩ් බන්ධනාගාර ආදි වශයෙනි. දීර්ඝ කාලීන නැත්නම් නැවත නැවත සිරගත වන RRC (Re-Re-Convicted) පුද්ගලයන්ගෙන් සිරගෙදරට ආවේණික භාෂාවේ නිර්මාණයටත් පැවැත්මට ලැබෙන දායකත්වය අතිමහත්ය.

බන්ධනාගාර භාෂාව පිළිබඳ සොයා බැලීමේදී හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ බොහෝමයක් ඇත. නොයෙක් තරාතිරමේ විවිධ ආකල්ප දරන නොයෙක් ගතිපැවතුම්වලින් යුත් විවිධ ජාතිවලට අයත් සිරකරුවන් එකට එක වීමෙන් මෙකී භාෂා ව්‍යවහාරයක් ඇති වේ.

බන්ධනාගාර ව්‍යවහාරික වචන පහත තිබේ. "කොරනි කාරයා" බොරුකාරයා හෝ මුදලක් රැගෙන පලායන්නා ලෙසද "වලි" දබර කර ගැනීම/රණ්ඩුව ලෙසද, "පක්කලියා" අනුන්ට පන්දම් අල්ලමින් තම වාසියට වැඩ කරනාගන්නා ලෙසද බන්ධනාගාරය තුළ ව්‍යවහාරය වේ. "සපලියා" ලෙස හඳුන්වන්නේ කිසිම වැඩකට නැති පුද්ගලයාය. රැකියා නැතිව නිකරුණේ කල් මරණ අයට "සුම්මසිරි" ලෙස හඳුන්වයි. යමක් තබා ගන්නට දුන් විට එය බොරු කියා නොදී සිටීම "මොත්තේ" ලෙස හඳුන්වයි. "ආතල්" ලෙස හඳුන්වන්නේ පහසුව හා ලෙහෙසියයි. "නීච" ලෙස හඳුන්වන්නේ පහත් නිවට ලෙසයි. බන්ධනාගාර රැඳවියන්ට කහ බත් සමඟ පපඩම් දුන් විට එය "මංජල් සෝරු මල් පපඩම්" ලෙස හඳුන්වයි. මඟ, පාර, මාර්ගය සඳහා ද්‍රවිඩ බසින් "වලි" ලෙස අර්ථවත් වුවත් බන්ධනාගාර ව්‍යවහරය තුළ වලි යනු රණ්ඩු වීමකි, අඬදබර කර ගැනීමකි.

බන්ධනාගාර වචනා කෝෂයෙහි ඉංග්‍රීසි වචන රාශියක් දක්නට ලැබේ. ඩන්ජන් (Dungeon) යන වදන නැතිනම් පොළොව අභ්‍යන්තරයේ වූ අඳුරු කුටියයි. නමුත් බන්ධනාගාරය තුළ එම වදනින් අර්ථවත් වන්නේ මැරෙන්නට ගැසීමයි. ඉංග්‍රීසියෙන් (Spot) යන්න සිර ගෙදරට භාවිතා වේ.

බන්ධනාගාර රැඳවියන් බන්ධනාගාරයේ එක එක ස්ථානවලට නම් ඇත. නිදසුන් ලෙස සිර කූඩුවන් සෙල්එක, සිර ගෙදර, ගල්පල්ලිය (බෝඩිම) සිර කුටි වොට් එක, සිර කුටියේ පැදුරු වලා, නිදන තීරුව බෝඩරේ ගත හැක. සිර කුටියේ පොදු ව්‍යවහාරයේ හිරගෙදර සාමාන්‍ය ඇඳුම් "ජිම්පරේ" ද කමිසයට "උඩ කැල්ල" කියාද නිතරම පවසයි.

ප්‍රධාන ජේලර් හට "හෙඩ් එක" ලෙසද බන්ධනාගාර නිළධාරී හට "කපුරාල" ලෙසද සුළු නිළධාරියාට "තාම්බුව" ලෙසත් පොලිස්කාරයාට "කේච්චිය හා ඌරා" ද ලෙස පවසයි. තවද අනුන්ට විපත් හෙලන්නා "ගිනිගෙඩි දෙන්නා" ලෙසත් බොරුකාරයාට "කොරනිකාරයා" ලෙසත් හොරකම් මංකොල්ල කන අය "ලෝකඅන්තුවා" ලෙසත් හඳුන්වයි.

බන්ධනාගාර රැඳවියන් නෑමට පෙර "ජලභීතිකාව" ලෙස හඳුන්වයි. හුභක් සඳහා "අම්බානක්" ලෙස හඳුන්වයි. කිසිම කමකට නැති "අමු" ලෙසත් හොඳ "නියම" ලෙසත් ලොකු, විශාල "බාර්ලියස්,

මෝගන්" ලෙස ද විශ්මයට පත් වූ විට "අම්මට උඩු" ලෙසත් පිළිවෙළ, ක්‍රමය "ශයිලය" ලෙස ව්‍යවහාරය වේ.

බන්ධනාගාරය තුළ වැරදීමක් යනු "අශිඩියා" නම් වේ. සතුට සුවය "ආසික් එක" කියනු ලැබේ. හොරකමක් කරන විට බලා සිට ඉල්ලන සන්තෝසම "ඇස්කුලිය" ලෙස බන්ධනාගාරය තුළ නම් වේ. බන්ධනාගාර රැදවියන් "කොරනිය" ලෙස හඳුන්වන්නේ බොරුවයි. කුඩුවලට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි පිරිස් "තගිස්" ලෙස හඳුන්වයි. හිරකරුවන්ට හිතවත් පාලකයා "අපේ බුවා" ලෙසද හිරගෙවල් මාරු කරන්නා "ඇස්කොට්" නමින් ද හඳුන්වයි.

බන්ධනාගාරය තුළ ස්ථාන හැඳින්වීමට ද විවිධ නම් යොදා ගන්නවා. සිරකරුවන් සිර කූඩුව බලු කූඩුවනී සෙල් එක ලෙසද සිර ගෙදර "ගල් පල්ලිය" නැතහොත් "බෝඩිම" ලෙස හඳුන්වයි. සිර කුටි "වොට් එක" ලෙස අමතයි. බන්ධනාගාරය තුළ විවිධ සුලු කර්මාන්තයන් ක්‍රියාත්මක වේ. ඒවා හඳුන්වන්නේ පාට් නමිනි. මහ සමාජය තුළ පාට් යනු විනෝද වන ස්ථානයකි. අවස්ථාවකි. නමුත් බන්ධනාගාරය තුළ පාට් කය වෙහෙසා වැඩ කර නිෂ්පාදන බිහි කිරීමකි.

කිසියම් වූ ක්‍රියාවක් කර ඊට සරිලන මුදලක් ලබා ගැනීමක් වෙයි. බන්ධනාගාරය තුළ සිදුවන නීති විරෝධි ක්‍රියා දෙස බලා සිට වැරදිකරු රකින බව පොරොන්දු වී ඉල්ලන කුලිය "ඇස් කුලිය" නම් වෙයි. ඇස් කුලිය ලැබීමට ඔහු කලේ ඇසින් දැකීම පමණි. වහ දුන් විට කිසිවෙකුට ඔහු මිය යයි. ජරාවක් ශරීරගත වූ විට පුද්ගලයා විකෘති වෙයි. ඉස්ම යනු සාරයයි. වහ දීම ජරාව දීම.

දේශපාලන වේදිකා මත මැතිවරණ සමයේ අපට නිතර ශ්‍රවණය කළ හැකි භාෂාත්මක යෙදුම්

12

ජනපති සටන

සජිත් - රනිල් කල්ලියේ බොරුවලින් මාලිමාවේ ජය වළක්වන්න බෑ

එකිනෙකා පරයමින් ජයග්‍රහණය ලබා ගැනීම උදෙසා මැතිවරණ සමයේ වගේම අනෙකුත් දේශපාලන වේදිකාවේ යොදා ගනු ලබන භාෂාව නවමු කවි, ගීත, සාම්ප්‍රදායික යෙදුම්, රූඩිවලින් අනූන වූවකි. කරට කර තරග වදින දේශපාලඥයින්ගේ මුවින් පිටවන වචන ජයග්‍රහණය සඳහා ද ප්‍රධාන හේතුවක් බව ඒ පිළිබඳ අධ්‍යනය කිරීමේදී හඳුනා ගත හැක. එමෙන්ම මැතිවරණ සමයේ බෙදාහරින අත්පත්‍රිකා, පෝස්ටර් හා දැන්වීම් තුළත් අන්තර්ජාලය, රූපවාහිනිය තුළත් යොදනු ලබන ප්‍රචාරණයන්හි ද භාෂා භාවිතය සුවිශේෂී වේ. වචනය කෙතරම් ප්‍රබලද යන්න කිවහොත් නිවැරදිව උච්චාරණ නොකරන වචන අල්ලා ගනිමින් දේශපාලන වේදිකාවෙහි හාස්‍යයට ලක් කරන අයුරු අප කොතෙකුත් අසා ඇත.

පත්තර සහ පෝස්ටර්වලින් උපුටා ගත් පාඨ කිහිපයක් බලමු.

- උෟවේ මිණිපහන
- ජාතියේ ගැලවුම්කරු
- මහ රජාණෝ
- රටේ ඉහළම පුරවැසියාගේ සැප මාලිගා
- ජාතියේ මුර දේවතාවක්
- පොහොට්ටුවෙන් පූට්ටුවක්
- ඡන්ද කල්දාන සාස්තර පොත එළියට
- අතෙන් ගැලවුණු අය අද අනාගත සැලසුම් හදනවා
- නින්ද ආයෙත් ඇක්ටිව් ද?
- ඇමතිකම් දෙන්න දෙවියන්ට කියති
- "අගමැතිවරිය විපක්ෂයට ටොක්කක් අනියි."
- කාගෙ කාගෙත් අයිස් එළියට එනවා
- සෙට් එකම ගෙදර යවන්න ඕන

දේශපාලන වේදිකාවේ නායකයන් උදෙසා විවිධ යුගවල බිහි වූ ගීත

ජයගත්තා මව්බිම
නායකයා ගෝඨාභය
සැකයක් නෑ ඔබ ගැන
බයක් නෑ දැන් දැන් රට ගැන
අපේ රට ගැන

බේබිලාට දෙන්න එපා රේස් දාන මාළිගාවේ
ෂෝෂල් මීඩියා බ්ලොක් කරන්න එපා හිතුමතේ
පෙට්‍රල් පෝලිම් - ගෑස් පෝලිම් - ඇති වෙලා අපිට පාරේ
ඡන්දේ දුන්නේ රට හදන්න වැඩ කරන්න දවස ගානෙ
අවුරුදු 4 හමාරක් ඇතිවෙලා බොරු අහලා
රවට්ටන්න එපා Please උන් වගේම ඔබලා

කුඩු බඩු කඩු වාඩු පාඩු නතර කරල
අප වැටිච්ච තැනින් ගොඩ දාන්න කියමි වදං
පොට්ටුව මොට්ටුවටත් ඒක වගේ සලකන්න
වෙට්ටු දාලා යන හොරුන්ට එපා කිරි පොවන්න

කුට්ටි වලට මුට්ටි දාපු කට්ටි නැති කරන්න
මහ ඡන්දෙදි අපිත් එක්ක ඔබත් හිටගන්න

අන්තවාද ජාතිවාද ජාතිභේද දුරලා
කිසිම කෙනෙක් බේරගන්න එපා
අයියා උනත් වැරදි කළොත් හදාගන්න බැනලා
රට රකින්න පුලුවන් ඒ ඔබයි උතුම් මිනිසා
ජය ගන්ව මව්බිම
නායකයා ගෝඨාභය

මහරජාණෙනි ගීතය

ආයු බෝ වේවා

ආයු බෝ වේවා
සිව් මහ බඹුන් තුන් විවරණින්
අපටත් රජෙක් පහළව ඇතේ
ඒ මහ රජුන් පෑ පෙළහරින්
මේ දෙරණ එක් සේසත් කළේ //
ආයු බෝ වේවා
මහරජාණෙනි
යාපා පටුන උතුරින්
දකුණින් දෙවුන්දර තුඩුවෙන්
නැඟුණු දුක් සෝ සුසුම් නිවමින්

සමගි බල මහිමෙන්
දෙස් විදෙස් අභියෝග බිඳ හැර
මහරජාණෙනි
ආයු බෝ වේවා
මහරජාණෙනි
නැගෙනහිර අභිමන්
වසත් කාලය ගෙනදුන්
උතුරු කරයට වසන්තයත්
දෙරණ දිනු දෙවිඳුන්
දෙස් විදෙස් ඇස් මවිත කරවයි
මහරජාණෙනි
ආයු බෝ වේවා
මහරජාණෙනි

වත්මන් ජනපතිට නිර්මිත ගීතය

පුනරුද යුගයට ජන බලවේගය

ප්‍රේම චන්ද්‍ර ලංකාතිලක
ලකඹර ගණඳුර බිඳ හැර පෑයූ
උදා ළහිරු හිරු සේ
පුනරුද යුගයට ජන බලවේගය
ගෙනයමු ලක් දෙරණේ
ලක් මව සුරකින යුග යුග මෙහෙවර
ඉටු කරළමු පොළොවේ //
ආ... හා හා හා......

අරුණළු පැතිරෙන රන්වන් යුගයට
අපි සැම පිය නගමු
සුන්වී ඇති ජන ජීවිත එක එක
හරිලෙස ගොඩ ගනිමු
ජන හද මැද බැබලේ
අනුරට ජය ජය වේ //
ආ... හා හා හා......

සොබා දහම අප සැමහට දී ඇති
සම්පත් රැක ගනිමු
සංවර්ධනයට ඒ සැම ඒක් කර
නිසි ලෙස හසුරවමු
ජාතික සමගිය වේ
අනුරයි බලවේගේ

මෛත්‍රී විජයග්‍රහණය

පුලතිසි පුරවර උපන් පුතෙක්
දැයම අවදි කළ සුබ මොහොතක්
මිනිසත් කම්පිරි හිත මිතුරෙක්
තුන් සිහලයම ඒක් කළ දවසක්
ලක් දෙරණේ ජය දද නංවා
අහස උසට ජය ගොස නැගෙනා
චිරං ජයතු නායකයාණෙනි //
චිරං ජයතු චිරං ජයතු නායකයාණෙනි
නොහොම්නකම් මැද අගාධයට යන
රට රැක ගන්නට ආ විරුවෙක්
ලොකු පොඩිකම් නැති දුක සැප හඳුනන
උපන් බිමට ණය නැති හෙළයෙක්
ලක් දෙරණේ ජය දද නංවා
අහස උසට ජය ගොස නැගෙනා
චිරං ජයතු නායකයාණෙනි //
චිරං ජයතු චිරං ජයතු නායකයාණෙනි
බාධක මැඩගෙන නොබියව සපැමිණ
සිංහ තේජසක් ඇති මිනිසෙක්
අද සිට මේ රට සවිමත් කරනට
පිනට පහළ උනු නායකයෙක්
ලක් දෙරණේ ජය දද නංවා
අහස උසට ජය ගොස නැගෙනා
චිරං ජයතු නායකයාණෙනි පුලතිසි පුරවර

තවත් එක් ගීතයක්

නුවර එළියේ සීතලේ රට රත් කළ රනිල්
මැයි රැලි මැද දේශපාලන පුරසාරම්
හකුරු හොද ඒත් පදුවා නරකයි
දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක් අලුත් දේශපාලන සංස්කෘතියක්
යුතුකමේ මනාපය දිනවමු
බුද්ධිමත් සැමගේ මනාපය
පොදුජන පැතුම වපුරන රන්කෙත
ප්‍රබුද්ධ විපක්ෂයක්
කැලි කැඩුණු උතුරේ දේශපාලනය
හිසරදේට කොට්ටය මාරු කිරීමක්ද?
නොමැකෙන නන්දන ලකුණ
සජිත් අනුර සටන උග්‍රයි
දියතෙන් දෝතක්
ව්‍යවස්ථාදායක "කළු සටන"
ජනාධිපති රනිල් තමයි
රට අනුරට
උපන්ගෙයි අවලංගු වන පුහුතර්ක
අපි අපේ පාරේ යන්නෙ
I.M.F. එක එක්ක දීග කෑම
හොරු අල්ලන සටන
පුළුවන් ශ්‍රී ලංකා
ගෙදර යන ආණ්ඩුව
රට ගොඩ දැම
වැටුන රටට නායකත්වය
දත් මැදගෙන ඉන්නව පුටුවෙ ඉදගෙන
රට ගිනිගත් වෙලාව
බලයට එන්න පාර හැදීම
වෛරයේ බීජ වපුරන උසිගැන්වීම

ඡන්ද උණුසුමේ වේදිකාව මත, අත්පත්‍රිකා මත නිතර ඇසෙන මෙවැනි වදන් තුළින් අන්වර්ථ නාම තුළින් කුමන පක්ෂයක්දැයි, කුමන පුද්ගලයෙක්දැයි දෙනු ලබන ඉඟිවලින් හඳුනාගත හැක.

වෙනත් භාෂාවක් භාවිතා කරන අය

- ඒක - යේක
- මහත්තයා - මාත්තියා
- එපා - යෙපා
- ඇතුළට එන්න - ඒතුළට යෙන්න
- ඇත්ත - එත්ත
- හරි හරි - සරි සරි
- හිතට - ඉතට
- හිමින් - ඉමින්

ආදී වශයෙන් අප සවනත වැකේ. මීට හේතුව ලෙස මා දකින්නේ දෙමළ භාෂාව තුළ සිංහල භාෂාවේ මෙන් පිල්ලම් අඩුවීම විය හැක. එලෙස කතෘ කර්ම හාස්‍යයක් ලෙස අප නොදකිමු. එයට කුඩා ළමුන් වන අප ආසා කරමු. සිංහල භාෂාව කතා කිරීමට හුරුපුරුදු අපි ඉංග්‍රීසි භාෂාව හැසිරවීමත් එලෙසමැයි මට ද සිතේ.

මීට අමතරව පොදුවේ සමාජය තුළ භාවිත වන වචන තුළ ඇති අදහස් බලමු

- ❖ මළ හතරැස් වෙනවා - අධික තරහ
- ❖ මළ පනිනවා - තරහා යනවා
- ❖ බඩුව - නරක හැසිරීම් ඇති ස්ත්‍රීන් සඳහා
- ❖ කැල්ල - පෙම්වතිය
- ❖ කොටු පනිනවා - අනියම් ඇසුරකදී
- ❖ ඇණය - කරදරකාර අයෙක්
- ❖ පට්ට - නියමයි
- ❖ ලොකු අතු අල්ලනවා - පොහොසත් අය හා එක්වීම
- ❖ කාගෙත් සුන්දරී - අනාචාරයේ යන ස්ත්‍රීන්ට
- ❖ බඩු බනිස් තමයි - අරමුණ ඉෂ්ඨ කරගත් අවස්ථාවක/ කුමන හෝ දෙයක් සාක්ෂි සහිතව හසු වූ විට
- ❖ සං ගාලා එනවා - ඉක්මනින්
- ❖ පට ගාලා යනවා - ඉක්මනින්
- ❖ රෙද්ද - තරහයන අවස්ථවලදී භාවිත වේ
- ❖ පිස්සු පීකුදු - හුදෙක් මනස නිරවුල් නොවූ විටෙක
- ❖ රම්පෙට පොරි හැලෙන්න - හිතුවටත් වඩා හොඳින්
- ❖ ඒ වූ ඉසඩ කියනවා - සියලු දේ කීම

වර්තමාන ව්‍යවහාරයේ නිතර කොයික අතරත් භාවිත වන වචන

- ❖ වැට උඩ - විශ්ව විද්‍යාල කඩයිම Z ලකුණ පොඩි ප්‍රමාණයක් එහෙ මෙහෙ වන විට මේ ළමයා වැට උඩනේද? යනුවෙන් සමාජයේ කතාබහට ලක්වෙයි.

- ❖ මළ පනිනවා, තද වෙනවා, මළ හතරැස්වෙනවා ආදී වශයෙන් තරහ යන වෙලාවක ඇතමුන්ගේ කටින් ඉබේටම කියවේ. මළ බද්ධය හැදුණු විටත් මෙලෙසින්ම භාවිත කරයි.

පොදු වෙනත් ව්‍යවහාර

එපමණක් නොව වර්තමානයේ "සිංග්ලිෂ්" වචන භාවිතයක් ද දක්නට ලැබේ. බොහෝ දෙනා නොලියන අතර පණිවිඩ යැවීම සිදු කරන්නේ SMS හරහා ය. "මැසේජ් (Massage) කරනවා" "Text කරනවා" යනුවෙන් නිතර කියති. මේවා සිංහල වචන ශබ්ද කරන අයුරින් ඉංග්‍රීසි අකුරු යොදා ලියයි. උදාහරණ ලෙස,

- අපි හෙට එනවා - Api heta Enawa
- ඔයා එන්නේ කවදාද? - Oya enne kawadada?

ඉහත ආකාරයට type කර යවයි.

ඇතැම් විටෙක අද බහුලව ඉංග්‍රීසි වචනය සමඟ සිංහල වචනයක්ද එකතු කරමින් ව්‍යවහාර කරයි. "Delete කරන්න, On කරන්න, Text කරන්න, Touch එකේ ඉන්න, Results කොහොමද ඔයාගෙ?" මේ ආදී වශයෙන් බහුලව ඉංග්‍රීසි මිශ්‍ර බසක් භාවිත කරයි.

<u>අපේ බස සුරකිමු</u>

රම්පෙ, කරපිංචා, සුදුළූණු, උළුහාල්, තුනපහ, උම්බලකඩ, ලුණු, කුරුඳු පොතු එකතු කරමින් රසවත්ව හදන හොද්දක සුවඳ කෙතරම්ද? භාෂාවත් එසේ ම යැයි මට සිතේ. රූඩි (ඉඟිවැකි), ප්‍රස්තාව පිරුළු, යුගල පද, තනි පද, බහ්වර්ථ පද ආදී නොයෙකුත් අලංකරණයන්ගෙන් සුසැදි හෙළ බසෙහි වරුණ ආඩම්බරයයෙන් රස විඳිමි. වියැති යන හෙළ බසෙහි රූ රටා එලෙස නොවන්නට නැගී සිටිමු.

ස්තූතිය

මෙම පොත සෑදීමේදී මා හට තොරතුරු ලබාදෙමින් උපකාර කළ ජේලර් ශ්‍යාමා කුමාරි මෙනවියටත්, සිද්ධාර්ථ විද්‍යාලයීය ආචාරිණී සඳමාලි කරුණාරත්න ගුරු මෑණියන්ටත්, විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන අක්කලාටත් අයියලාටත්, ග්‍රන්ථකරණයට නිති ගුරුහරුකම් ලැබදෙන සිසිර ගමගේ සීයාටත්, මෙවැනි අවස්තාවක් අප හට ලැබදුන් මහමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්, සේනාරත්න ගුරු පියාණන්ටත්, නන් අයුරින් සහයෝගය ලැබදුන් සැමදෙනාටමත් ගෞරවනීය ස්තූතිය පුද කරමි.

පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිශීලනය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)